ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.08.05

ඩී.ද සිල්වා විජේරත්න මහතා,
අංක : 44/7 සී, පාසල් මාවත,
නාවල.

**පැමිණිලි පාර්ශවය**

01. පො.කො. 81166 ජේ.පී.ගුණරත්න මහතා,
    පොලිස් ස්ථානය, මැදවච්චිය.

02. පො.කො. 90030 ඒ.සමන් දේශප්‍රිය මහතා,
    පොලිස් ස්ථානය, පින්නවල.

03. පො.කො. 91921 අයි.ඒ.හසන් මහතා,
    පොලිස් ස්ථානය, වැලිකඩ.

04. ස්ථානාධිපති,
    පොලිස් ස්ථානය, වැලිකඩ.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/1011/23**

පැමිණිල්ල :

පැමිණිලිකරු පැමිණිල්ලේ ප්‍රකාශ කර සිටින්නේ, තමා රොක්ලන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙහි අධ්‍යක්ෂවරයෙකු බවත්, තමා 2023.02.12 දින කොළඹ මේට්ලන්ඩ් චන්ද්‍රවංකය පාරේ පිහිටි කසාගෝ නමැති සමාජ ශාලාවට ගොස් අලුයම 1.00 ට පමණ ත්‍රිරෝද රථයකින් තම නිවස වෙත පැමිනෙමින් සිටි බවත්, එම අවස්ථාවේදී තමාට නින්ද ගොස් තිබු බවත්, නාවල ප්‍රෙද්ශයේ පාසල් මාවත ආසන්නයේදී ත්‍රිරෝද රථය නවතා පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් ත්‍රිවිල් රථ රියදුරා සමඟ කථා කරමින් සිටි බවත්, ඔවුන් ත්‍රිවිල් රියදුරාට හිරිහැර වන අන්දමින් කටයුතු කළ බවත්, එම පොලිස් නිලධාරීන් දෙදෙනා තමාගෙන් රු. 5,000/- ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා සිටි බවත්, තමා එය ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්ය. ඉන්පසුව එම නිලධාරීන් දෙදෙනා ත්‍රිවිල් රියදුරාට හිරිහැර කළ බවත්, එම ස්ථානය තමාගේ නිවසට ආසන්නව පැවති බැවින්, තමා ත්‍රිවිල් රථයෙන් බැස නිවසට පයින් යාමට තීරණය කළ බවත්, එවිට පොලිස් නිලධාරියෙක් තමාට පහර දුන් බවත්, තමාගේ ජංගම දුරකථනය ද බිම වැටුනු බවත්, පසුව පොලිස් නිලධාරියකු විසින් තමාව යතුරු පැදියේ පිටුපස තබාගෙන වැලිකඩ පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්ය.

පසුව පොලිස් ස්ථානයේ කාමරයකට දැමූ බවත්, තමා විසින් ඉහත සිද්ධිය පටිගත කලා යැයි සැක සිතූ පොලිස් නිලධාරීන් දෙදෙනා තමාගේ ජංගම දුරකථනයේ ලොක් එක ඉවත් කර දෙන මෙන් දන්වා සිටි



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බවත්, නමුත් තමා එම ලොක් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කළ බවත්ය. එම ස්ථානයේ හසන් නැමති පොලිස් නිලධාරියා සිවිල් ඇඳුමින් සිටි බවත්, ඔහු තමා අසලට පැමිණ තමා පැළඳ සිටි මාලය කඩා පොලවට දමා ගැසූ බවත්, එය රු. මිලියන තුනක් පමණ වටිනා එකක් බවත්, ඔමේගා ස්පීඩ් මාස්ටර් වර්ගයේ තමාගේ අත බැඳි ඔරලෝසුව ගලවා ගත් බවත් ප්‍රකාශ කරයි. පසුව තමාට පොලිස් ස්ථානයේදී පහරදුන් බවත්, පසුදින එනම්, 2023.02.13 දින අයිස් මත්ද්‍රව්‍ය සන්තකයේ තබා ගත්තා යැයි බොරු චෝදනා මත කොළඹ අළුත්කඩේ අංක 04 මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත.

තවදුරටත් පැමිණිලිකරු කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ, තමාව අත්අඩංගුවට ගැනීමට පෙර කිසිදු පරික්ෂාවක් සිදු නොකළ බවත්, අත්අඩංගුවට ගැනීමට හේතු දැක්වීමක් ද සිදුනොකළ බවයි. පසුව තමා විසින් මේ සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට සහ මිරිහාන පොලිස් ස්ථානයේ පොලිස් අධිකාරිවරයා වෙත පැමිණිල්ලි කළ බවයි.

පැමිණිලිකරු 2024.05.31 දිනැතිව ඉහත කරුණු තහවුරු කරමින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, පොලිස් ස්ථානයේ ඇති කාමරයකදී සිවිල් ඇඳුමින් සැරසී සිටි නිලධාරියා විසින් තමන්ට පහරදුන් බවත්, පසුව ඔහුගේ නම සහ අංකය දැනගත් බවත්, එම නිලධාරියා තමාට පහරදී තමාගේ පුද්ගලික දේපළ නීති විරෝධී ලෙස උදුරාගත් බවයි. එසේම, අධිකරණයට සාවද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ බවත්, තමාව අත්අඩංගුවට ගනු ලැබුවේ ඔබේසේකරපුර දී යැයි එම වාර්තාවේ සඳහන් කර ඇතත්, සත්‍ය වශයෙන්ම තමාව අත්අඩංගුවට ගනු ලැබුවේ නාවල පාසල් පටුමග ප්‍රදේශයේ දී බවත්, එය සීසී ටීවී දර්ශන මඟින් තහවුරු වන බවත්, කොමිෂන් සභාව වෙත එම සීසී ටීවී දර්ශන ඉදිරිපත් කර ඇති බවත්ය. එසේම ඔබේසේකරපුරදී අත්අඩංගුවට ගෙන පරීක්ෂා කළ බවට වගඋත්තරකරුවන් වාර්තාවේ සඳහන් කර තිබුණද, එසේ කිසිදු පරික්ෂාවක් සිදු නොකළ බවට සීසී ටීවී දර්ශන මඟින් තහවුරු වන බවයි.

තවද, අධිකරණයට ඉදිරිපත් කළ වාර්තාවේ අයිස් මිලි ග්‍රෑම් 118 ක ප්‍රමාණයක් සොයාගත් බවට දක්වා ඇති බවත් නමුත්, තවත් ස්ථානයක හෙරොයින් මිලි ග්‍රෑම් 118 ක ප්‍රමාණයක් සොයාගත් බවට දක්වා ඇති බවයි.

ඒ අනුව පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, තමාව අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවත්, වගඋත්තරකරුවන් විසින් එසේ අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවයි.

පැමිණිලිකරු විසින් පැමිණිල්ල තහවුරු කිරීම සඳහා කොළඹ ජාතික රෝහලේ අධිකරණ වෛද්‍යවරයාගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම වෛද්‍ය වාර්තාවට අනුව ඇසට ඉහළ කොටසේ 1cm ප්‍රමාණයේ කැපුම් තුවාලයක් ඇති බවත්, ඊට අමතරව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්, එනම් වම් ඇහි බැම උඩින් 2cm ක ප්‍රමාණයේ තැලීම් තුවාලයක් ද, දකුණු ඇසෙහි ඇහි බැම වලට යටින් 2cm X 1cm ප්‍රමාණයේ තැලීම් තුවාලයක් ද ඇති බවත් දක්වා ඇත. අධිකරණ වෛද්‍යවරයා විසින් තම මතය සඳහන් කරමින් රෝගියා විසින් ලබාදී ඇති රෝග ඉතිහාසය සහ තුවාල සැසඳෙන බව එහි දක්වා ඇත.

එසේම පැමිණිලිකරු විසින් 2023.02.13 දින නවලෝක රෝහලෙන්ද වෛද්‍ය වාර්තාවක් ලබාගෙන ඇත. මෙම පැමිණිලිකරු, තමා මත්ද්‍රව්‍ය පානය නොකරන්නෙක් බවට තහවුරු කිරීම සඳහා එම වෛද්‍ය වාර්තාව ලබාගෙන ඇති අතර, එම වෛද්‍ය වාර්තාව අනුව ඔහු මත්ද්‍රව්‍ය පාවිච්චි කර සිටි බවට සඳහන් කර නැත.

තවද අලුත්කඩේ මහේස්ත්‍රාත් අංක 04 හි පැවති 85961/23 දරණ නඩුවේ සම්පූර්ණ නඩු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුව එම නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇත. එම නියෝගය අනුව ගරු විනිශ්චයකාරතුමා දක්වා ඇත්තේ, පැ.සා. 1 සාක්ෂියේ දැඩි පරස්පරතාවයක් පවතින බවත්, පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, පාසල් මාවතේදී වුවත්, බී වාර්තාවේ දක්වා ඇත්තේ ඔබේසේකරපුර දී බවයි. ඒ අනුව අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දැඩි පරස්පරතාවයක් ඇති බවත්, නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 178/23 යටතේ හෙරොයින් මිලි ග්‍රෑම් 118 ක් බවට දක්වා ඇතත්, රස පරීක්ෂක වාර්තා සඳහා යවා ඇත්තේ අයිස් නැමති මත්ද්‍රව්‍ය බවත්, ඒ අනුව අත්අඩංගුවට ගනු ලැබූ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්ද බරපතල පරස්පරයක් පවතින බවත්ය.

අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පැමිණිලිකරු පරීක්ෂා කිරීමකට ලක් කිරීමක් සිදුව නොමැති බවට තහවුරු කිරීම සඳහා පැමිණිලිකරු විසින් සිද්ධිය වූ ස්ථානයේ සීසී ටීවී දර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :**

- **01 වන වගඋත්තරකාර පො.කො. 81166 ජයතිලකගේ ජානක ප්‍රසන්න ගුණරත්න යන අයගේ ප්‍රකාශය**

වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, තමා වර්තමානයේ මැදවච්චිය පොලිස් ස්ථානයේ සේවය කරන බවයි.

2022.01.15 දින සිට වැලිකඩ පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන ලද බවත්, 2023.02.12 දින සවස 6.00 සිට පසුදින උදෑසන 6.00 දක්වා පො.කො. 90030 දේශප්‍රිය නිලධාරියා සමඟ ක්ෂණික දුරකථන අංක 118 සහ 119 යතුරු පැදි සංචාරයේ රාජකාරි කරන ලද බවත්, 118 සහ 119 දුරකථන වලට ලැබෙන පැමිණිලි වලට විමසීම් කිරීම සහ වසමේ ප්‍රභූවරුන්ගේ නිවෙස් වල සහ කාර්යාල වල දමා ඇති පොලිස් පොත් අත්සන් කිරීම තමාට පැවරී තිබූ රාජකාරිය බවයි. එදින එම දුරකථන ඇමතුම් වලට පැමිණිලි 13 ක් ලැබී තිබූ බවත්, පාන්දර 1.00 ට පමණ නාවල පාසල් පටුමඟ හි පිහිටි ටිරාන් අලස් මහතාගේ නිවසේ දමා තිබූ පොලිස් පොත අත්සන් කර නැවත පොලිසිය දෙසට එනවිට ප්‍රධාන පාරේ සිට පාසල් පටුමඟ දක්වා ත්‍රිවිල් රථයක් පැමිණි බවත්, එම ත්‍රිවිල් රථය නතර කර රියදුරාගේ රියදුරු බලපත්‍රය පරීක්ෂා කරන ලද බවත්, පසුව ත්‍රිවිල් රථයේ පිටුපස ආසනයේ පැමිණි අය පරීක්ෂා කිරීමේදී එම අයගේ කලිසම් සාක්කුවේ විනිවිද පෙනෙන කවරයක තිබී අයිස් මත්ද්‍රව්‍ය සොයාගත් බවත්ය.

කොමිෂන් සභාව විසින් වගඋත්තරකරුගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ප්‍රශ්ණ විමසා ඇති අතර, එහිදී අයිස් මත්ද්‍රව්‍ය තිබූ බවට සෘජුවම හඳුනා ගත්තේ කෙසේද යන්න විමසා ඇති අතර, තමාගේ අත්දැකීමෙන් එය හඳුනාගත් බවට වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. කොපමණ මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාවක් සිදුකර තිබේද යන්න විමසීමේදී තමා අනුරාධපුර සේවය කරන කාලයේදී එක් වැටලීමක් සඳහා සහය වී ඇති බව වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

තවද ත්‍රිවිල් රථ රියදුරා පරීක්ෂා කිරීමට පෙර ත්‍රිවිල් රථයේ පිටුපස සිටි පුද්ගලයා තමන්ව වීඩියෝ ගත කිරීමට සූදානම් වූ බැවින්, ඒ පිළිබඳව සැකයක් මතුවීමෙන් පසු ඔහුව ද පරීක්ෂා කිරීම සිදුකළ බවත්, පොලිස් ස්ථානයේ දී එම පුද්ගලයා තමාට බැණ වැදුනු බවත්, අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය දූෂන මර්ධන ඒකකය වෙත ගෙන ගොස් කිරා මැන බලා සැකකරුව උපසේවක වෙත භාරදුන් බවත් සඳහන් කරයි.

තවදුරටත් වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, තමා විසින් අත්අඩංගුවට ගැනීම පමණක් සිදුකළ බවත්, අදාළ බී වාර්තාව සහ චෝදනා පත්‍රය සකස් කරනු ලබන්නේ නඩු මෙහෙයවන නිලධාරීන් බවත්, ඔවුන් විසින් බී වාර්තාව වැරදියට සකස් කර ඇති බවත්, චෝදනා පත්‍රයේ අඩුපාඩු පැවති නිසා අධිකරණය විත්තිකරුව නිදොස් කොට නිදහස් කළ බවත්, මෙම සිදුවීමේදී තමා රාජකාරිය පමණක් සිදුකළ බවත්ය.

පැමිණිලිකරුට පහරදීම සහ තුවාල සම්බන්ධයෙන් විමසීමේදී 01 වන වඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීමෙන් පසුව සැකකරු සිර මැදිරියේ සිරගත කළ යුතු  බවත්, නමුත් සැකකරු සිර මැදිරියට යාම ප්‍රතික්ෂේප කරන ලද බවත්, සිර මැදිරියෙන් එළියට ඒමට සූදානම් වූ බවත්, සැකකරුව නැවත සිර මැදිරිය තුළට යොමු කරන විට ළමා හා කාන්තා කාර්යංශයේ තිබූ දැන්වීම් පුවරුවක වැදී ඔහුගේ නලලේ සීරීම් තුවාලයක් වූ බවත්, පසුව පොලිස් ස්ථානයේ තිබූ බෙතඩින් බෙහෙත් දැමූ බවත්ය.

- **02 වන වගඋත්තරකාර පො.කො. 90030 අරණායකගේ සමන් දේශප්‍රිය යන අයගේ ප්‍රකාශය**

02 වන වගඋත්තරකරු වර්තමානයේ පින්නවල පොලිස් ස්ථානයේ සේවය කරන බවත්, පැමිණිල්ලේ සඳහන් සිද්ධිය වූ දින එනම්,  2023.02.12 දින පැය 18.00 සිට පසුදින පැය 6.00 දක්වා 119 සහ 118 රාජකාරි සඳහා පො.කො. 81166 ගුණරත්න නිලධාරියා සමඟ යතුරු පැදියෙන් පිටව ගිය බවත්, එදින වසමේ තිබූ පොත් අත්සන් කිරීම සහ 119 මඟින් ලැබෙන පණිවිඩ වලට ක්‍රියා කිරීම සිදුකළ බවත්, පාන්දර 1.00 ට පමණ පාසල් පටුමඟහි ටිරාන් අලස් මහතාගේ නිවසේ තිබූ පොත් අත්සන් කරන ලද බවත්, අත්සන්

කර ආපසු එනවිට ත්‍රිවිල් රථයක් ඉදිරියට ආ බවත්, එම කාලය වාහන වල සයිඩ් කන්නාඩි නැති වන කාලයක් බැවින්, එම ත්‍රිවිල් රථය නතර කර රියදුරු බලපත්‍රය පරීක්ෂා කළ බවත්, ත්‍රිවිල් රථය පරීක්ෂා කර පිටව ඒමට සූදානම් වනවිට රථය පිටුපස සිටි අය තමන් දෙදෙනාව වීඩියෝ ගත කිරීමට සූදානම් වූ බවත්, ඒ අනුව මතු වූ සැකය හේතුවෙන් තම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ උපදෙස් මත එම තැනැත්තා ද පරීක්ෂා කරන ලද බවයි.

අසන ලද ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් 02 වන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, ත්‍රිවිල් රථයේ සිටි පුද්ගලයා ඔහුවත් පරීක්ෂා කරාවි යැයි සැක සිතූ නිසා වීඩියෝ ගත කිරීම සිදුකළ බවත්, ඒ හේතුවෙන් ඔහු පිළිබඳව මතුවූ සැකය මත පරීක්ෂා කරන ලද බවත්, ප්‍රථමයෙන් ත්‍රිවිල් රියදුරු පරීක්ෂා කර පිටවව යන විට මෙම වීඩියෝ ගත කිරීම දැකීමෙන් පසුව ඔහුව ද පරීක්ෂා කරන ලද බවත්, එසේ පරීක්ෂා කිරීමේදී ඔහුගේ වම් සාක්කුවේ සුදු පැහැති පැකැට්ටුවක් තිබූ බවත්, එය තමා විසින් තමාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙත ලබාදුන් බවත්ය.

තවද, සැකකරුව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගිය අවස්ථාවේදී පො.කො. 91921 හසන් නැමති නිලධාරියා ද පොලිස් ස්ථානයේ සිටි බවට 02 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව කොමිෂන් සභාව විසින් 03 වන වගඋත්තරකාර පො.කො. 91921 අයි.ඒ.හසන් නැමති නිලධාරියාට සිතාසි නිකුත් කළ අතර, ඔහු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී නොමැත. ඒ සම්බන්ධයෙන් වැලිකඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා දන්වා ඇත්තේ, මෙම නිලධාරියා 2024.11.07 දින සිට විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව රාජකාරියට වාර්තා නොකිරීම හේතුවෙන් නුගේගොඩ දිස්ත්‍රික් 11 සහකාර පොලිස් අධිකාරී විසින් ASP/NU(II)/OUT/5475/2024 සහ 2024.12.05 දිනැතිව තනතුර හැරයාමේ නියෝගය නිකුත් කර ඇති බවයි. ඒ අනුව පො.කො. 91921 හසන් නැමති නිලධාරියා දැනට සේවයේ නොමැති හෙයින්, සිතාසිය සම්බන්ධයෙන් දැනුම්දීමට නොහැකි වූ බවයි.

**නිරීක්ෂණ :**

පැමිණිලිකරු පිළිගත් පෞද්ගලික ආයතනයක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන බව පැමිණිල්ල මඟින් දක්වා ඇත.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ, නාවල් පාසල් මාවතේදී බවට නිරීක්ෂණය වන අතර, කොමිෂන් සභාවට වගඋත්තරකරුවන් කරුණු ඉදිරිපත් කිරීමේදී ඒ බව පිළිගෙන ඇත. නමුත් අධිකරණයට කරුණු වාර්තා කිරීමේදී ඔබේසේකරපුරදී අත්අඩංගුවට ගත් බවට අසත්‍ය ලෙස කරුණු ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ව විඩියෝ ගත කිරීමට යාමේදී බව නිරීක්ෂණය වේ.

02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම අනුව, ත්‍රිවිල් රථයේ රියදුරුව පරීක්ෂා කිරීමෙන් පසු නැවත හැරී යනවිට පැමිණිලිකරු ඔහුගේ ජංගම දුරකථනයෙන් වඋත්තරකරුවන් වීඩියෝ ගත කිරීමට සූදානම් වීමේදී ඒ පිළිබඳව සැකයක් මතුවීම නිසා පැමිණිලිකරුව පරීක්ෂා කිරීමකට ලක් කළ බව තහවුරු වන අතර, ඒ තුළින් පැමිණිලිකරු වීඩියෝ ගත කිරීමක් සිදුකලේ දැයි මතු වූ සැකය හේතුවෙන් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

ඉදිරිපත් කරන ලද සීසී ටීවී දර්ශන අනුව, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරුව පරීක්ෂාවකට ලක් කර නැති බව නිරීක්ෂණය වේ.

02 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුව පරීක්ෂා කිරීමෙන් පසු ඔහුගේ කලිසම් සාක්කුවේ විනිවිද පෙනෙන බෑගයක යමක් තිබී සොයාත් බවත්, එය 01 වන වගඋත්තරකරුට පෙන්වීමේදී අයිස් මත්ද්‍රව්‍ය බවට හඳුනා ගත් බවත්, එසේ හඳුනා ගත්තේ 01 වන වගඋත්තරකරුගේ අත්දැකීමෙන් බවත් ප්‍රකාශ කර ඇත. නමුත් 01 වන වගඋත්තරකරු මීට පෙර මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් එකදු වැටලීමක් හෝ සිදුකර නොමැති අතර, අනුරාධපුර ප්‍රදේශයේ සේවය කරන කාල වකවානුවේදී එක් මත්ද්‍රව්‍ය වැටලීමක් සඳහා සහය දීමක් සිදුකර ඇති බවට 01 වන වගඋත්තරකරු විසින්ම පිළිගෙන ඇත. ඒ අනුව යම් ද්‍රව්‍යයක් අයිස් මත්ද්‍රව්‍ය බවට ක්ෂණිකව හඳුනා ගැනීමට තරම් විශේෂඥ දැනුමක් 01 වන වඋත්තරකරු හට තිබී නොමැති බව නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට වෛද්‍ය වාර්තා අනුව නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී එක් පහරක් ද, අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් ස්ථානය තුළ දී ද පහරදීමකට ලක් වූ බව පැමිණිල්ලේ සඳහන් වන අතර, පොලිසිය තුළ දී 03 වන වගඋත්තරකරු විසින් එම පහරදීම සිදුකළ බවට පැමිණිල්ල අනුව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සන්තකයේ අයිස් මත්ද්‍රව්‍ය මි.ග්‍රෑ. 118 ක් තිබූ බවට සඳහන් කරමින් අත්අඩංගුවට ගෙන ඇති අතර, චෝදනා පත්‍රය ඉදිරිපත් කිරීමේදී සහ රස පරීක්ෂක වාර්තාව සඳහා ඉදිරිපත් කිරීමේදී හෙරොයින් මි.ග්‍රෑ.118 ක් තිබූ බවට දක්වා ඇති අතර, ඒ අනුව පැමිණිලිකරු සන්තකයේ නිසැකවම මත්ද්‍රව්‍ය තිබුනේ ද යන්න නිරීක්ෂණය නොවේ.

පොලිසිය විසින් පැමිණිලිකරුට විරුද්ධව අංක 55961/04/23 යටතේ අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවෙන් පැමිණිලිකරු නිදොස් කොට නිදහස් වී ඇති අතර, අත්අඩංගුවට ගත් ස්ථානය, නඩු බඩු ඉදිරිපත් කිරීම සහ ඉදිරිපත් කරන ලද සාක්ෂි වල දැඩි පරස්පරතාවයක් පැවතීම හේතුවෙන් පැමිණිලිකරුව එකී නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇති නිරීක්ෂණය වේ.

**නිගමනය :**

මෙම පැමිණිල්ලට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූලව සිදුකලේද යන්නත්, පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමේදී සහ අත්අඩංගුවට ගැනීමෙන් පසුව කෲර හා අමානුෂික සැලකිල්ලකට භාජනය වූයේද යන්නත් මෙහි විසඳිය යුතු ගැටළුව වේ.

මෙහිදී 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (1) ව්‍යවස්ථාවට අනුව නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියට පරිබාහිරව කිසිම පුද්ගලයෙකු සිරභාරයට නොගත යුතු අතර, එසේ සිර භාරයට ගන්නේ නම් ඒ සම්බන්ධයෙන් හේතු දැක්විය යුතු බව පැහැදිලිව දක්වා ඇත.

අත්අඩංගුවට ගැනීමේ කාර්ය පටිපාටිය 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23 වන වගන්තියේ සඳහන් වන අතර, එහිදී යම් තැනැත්තෙකු සිර භාරයට ගැනීමට හෝ එසේ සිර භාරයට ගනු ලබන තැනැත්තා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත නොවූවොත් මිස, එසේ සිරභාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිරභාරයට ගනු ලබන තැනැත්තාගේ ශරීරය සැබවින්ම ස්පර්ශ කොට හෝ රඳවා තබා ඔහුව සිර භාරයට ගත යුතුය. තවද, සිරභාරයට ගනු ලබන තැනැත්තා සිරභාරයට ගනු ලබන්නේ යම් චෝදනාවක් හෝ දෝෂාරෝපණයක් මත ද, එම දෝෂාරෝපණයේ හෝ චෝදනාවේ ස්වභාවය එම තැනැත්තාට දැන්විය යුතුය.

එසේම, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වන වගන්තිය යටතේ සංඥය වරදක් සිදුකරනු ලැබූ තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීමට සාම නිලධාරින්ට හැකියාව පවතින බව දක්වා ඇත. එසේ අත්අඩංගුවට ගැනීම සිදුකළ හැක්කේ, යම් පුද්ගලයෙකුට විරුද්ධව පැමිණිල්ලක් ලැබී තිබීම, විමර්ශනයකින් අනතුරුව ඒ සම්බන්ධයෙන් තහවුරු වී තිබීම, එම වරද සිදුකල බවට නිශ්චිත තොරතුරු ලැබී තිබීම සහ එම වරද සිදුකළා යැයි සාධාරණ සැකයක් තිබීම යන කරුණු මත බවට දක්වා ඇත.

සිද්ධිමය කරුණු වලට අනුව, යම් පුද්ගලයෙකු සතුව තහනම් මත්ද්‍රව්‍යයක් සන්තකයේ තිබෙන්නේ නම්, එවැනි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට සාම නිලධාරින්ට කිසිදු බාධාවක් නොමැති අතර, ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව අලුයම 1.00 ට පමණ පැමිනෙන රථයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සිදුකිරීම නීතියට පටහැනි නොවන අතර, අදාළ නීති රෙගුලාසි වලට සහ එහි ගමන් ගන්නා පුද්ගලයන්ට හිරිහැරයක් හෝ අපහසුතාවයක් ඇති නොවන ආකාරයට එම පරීක්ෂාව සිදු කළ යුතුය. මෙහිදී ත්‍රිවිල් රථයේ රියදුරුගේ බලපත්‍රය සම්බන්ධයෙන් ගැටළුවක් තිබුනු බවට වගඋත්තරකරුවන් කරුණු දක්වා නොමැත. එහෙත්, පැමිණිල්ලට අනුව, වගඋත්තරකරු ත්‍රිවිල් රථ රියදුරාගෙන් අල්ලසක් ඉල්ලූ බවට ප්‍රකාශ කරන අතර, එම සිද්ධිය පැමිණිලිකරු තම ජංගම දුරකථනයෙන් වීඩියෝ කිරීම සහ එසේ වීඩියෝ කළා යැයි සැක කිරීම හේතුවෙන් පැමිණිලිකරුව අත්අඩංගුවට ගත් බවද කරුණු අනුව නිරීක්ෂණය වේ. 02 වන වගඋත්තරකරු විසින් ලබාදුන් ප්‍රකාශය අනුව ත්‍රිවිල් රථය පරීක්ෂා කර නැවත හැරී යන අවස්ථාවේදී පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන් වීඩියෝ ගත කිරීමක් සිදුකිරීම නිසා ඔහුට සැකයක් මතුවූ බැවින්, පැමිණිලිකරු පරීක්ෂා කළ බවට පැහැදිලිව සඳහන් කර ඇත. එමගින් තහවුරු වන්නේ, පැමිණිලිකරු විසින් වගඋත්තරකරුවන්ව

වීඩියෝ කිරීම හෝ එසේ කිරීමට සූදානම් වීම මත එයට දැක්වූ අකමැත්ත හේතුවෙන් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමක් සිදුකළ බවයි.

එසේම, 01 වන වගඋත්තරකරු පැමිණ පැමිණිකරුව පරික්ෂා කිරීමෙන් පසු ඔහුගේ සන්තකයේ විනිවිද පෙනෙන බෑගයක් සාක්කුවේ තිබී සොයාගත් බවත් සඳහන් කරන අතර, එය පෙන්වූ විගස අයිස් මත්ද්‍රව්‍ය බවට 01 වන වගඋත්තරකරු විසින් නිගමනයකට පැමිණ තිබේ. නමුත්, 01 වන වගඋත්තරකරු හට එවැනි විශේෂඥ දැනුමක් නොමැති බවට 01 වන වගඋත්තරකරුගේම ප්‍රකාශය මඟින් තහවුරු වේ. මන්ද 01 වන වගඋත්තරකරු විසින් මීට පෙර කිසිදු මත්ද්‍රව්‍ය වැටලීමක් සිදුකර නොමැත. ඒ අනුව 01 වන වගඋත්තරකරු එම බෑගය දුටු පමණින් අයිස් මත්ද්‍රව්‍ය යැයි නිගමනයකට පැමිණීම ගැටළු සහගත වන අතර, එම කාරණය සත්‍ය බවට කරුණු අනුව අනාවරණය නොවේ.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ ඔබේසේකරපුරදී යැයි අධිකරණයට කරුණු වාර්තා කර ඇති නමුත්, සත්‍ය වශයෙන්ම පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ නාවල පාසල් මාවතේ දී බවට තහවුරු වන අතර, වගඋත්තරකරුවන්ගේ සටහන් වල **අයිස්** මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 118 ක් පැමිණිලිකරු සන්තකයේ තිබී සොයාගත් බවට සටහන් කර ඇතත්, අධිකරණයට ඉදිරිපත් කර ඇති බී වාර්තාවේ දක්වා ඇත්තේ **හෙරොයින්** මිලි ග්‍රෑම් 118ක් ලෙසයි.

ඒ අනුව මෙම අත්අඩංගුවට ගැනීම සහ ඉදිරිපත් කරන චෝදනා සම්බන්ධයෙන් දැඩි පරස්පරතාවයන් මතු වන අතර, පැමිණිලිකරු සන්තකයේ කුමන හෝ මත්ද්‍රව්‍යයක් තිබී ඒ මත මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ බවට තහවුරු කිරීමක් සිදුකර නැත. ඒ බව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 85961/04/23 නඩුවේ නියෝගය පරිශීලනය කිරීමේදී පෙනීයන්නේ මෙම නඩුකරය අසද්භාවයෙන් යුතුව පවරා ඇති බවට අධිකරණය නිගමනය කරන බවට ගරු මහේස්ත්‍රාත්තුමා වාර්තා කර ඇති බවයි. ඒ අනුව ඉහත කරුණු වැඩිදුරටත් තහවුරු වේ.

තවද, පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදුකර පැමිණිලිකරුගේ රන් මාලය කඩා දමා ඔහු පැළඳ සිටි ඉතා වටිනා අත් ඔරලෝසුව 03 වන වගඋත්තරකරු විසින් පැහැර ගැනීමක් සිදුකළ බවට ද පැමිණිල්ල මඟින් දක්වා ඇත. තවද, පොලිස් ස්ථානයට රැගෙන යාමෙන් පසුව ද 03 වන වගඋත්තරකරු විසින් පහරදීමක් සිදුකළ බවට කරුණු ඉදිරිපත් ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට දැක්වෙන අතර, එම තුවාල දෙක පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද රෝග ඉතිහාසය සහ සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වා තිබීම අනුව වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන අන්දමට පැමිණිලිකරු සිර කුඩුවේ සිටීම ප්‍රතික්ෂේප කරමින් සිර කුඩුවෙන් නැවත එළියට ඒමට උත්සාහ කිරීමේදී ළමා හා කාන්තා කාර්යංශයේ සවි කර තිබූ දැන්වීම් පුවරුවක් මුහුනේ වැදී තුවාල සිදුව ඇති බවට ඉදිරිපත් කරන කරුණු දැක්වීම පිළිගැනීමේ හැකියාවක් නොමැත. එසේම, පැමිණිලිකරුව පොලිස් උපසේවයට භාරදී ඇති අතර, එසේ උපසේවා නිලධාරි විසින් භාර ගෙන වැඩිදුර නියෝග ලැබෙනතෙක් සිර මැදිරියේ රඳවා තබා ගැනීම සහ නඩු භාණ්ඩ භාර ගැනීමේ සටහන් වල කැඩී ඇති රන් මාලයක් භාරගත් බවට ලේඛනයේ ඇතුළත් කර ඇති අතර, අත් ඔරලෝසුව සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නැත. ඒ අනුව ද වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරුට එරෙහිව බලය පාවිච්චි කිරීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

**නිර්දේශය :**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සමස්ත කරුණු සලකා බැලීමේදී වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම සහ 11 වන ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු (1987) 2 SLR 119</u> නඩුවේදී දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මඟින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර

නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද, කිසියම් අවස්ථාගත කරුණක් යටතේ වුවද එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

දිල්ෂාන් තිලකරත්න සහ වයි.කුමාරිහාමි එදිරිව සාජන් ඩග්ලස් ඇල්ලේපොල ඇතුළු වෙනත් අය SCFR 578/11 නඩුවේදී පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ ව්‍යවස්ථාදායක සහතිකය භුක්ති විඳීමට අයිතිය තිබිය යුතු අතර, සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවන්ට පවා වධහිංසාවට හෝ අමානුෂික හෝ නින්දිත සැලකිල්ලට හෝ දඬුවමකට යටත් නොවීමේ අයිතිය නීතියට අනුව පවතින බව දක්වා ඇත.

පී.ඒ.සී.මධුෂාන් එරෙහිව ස්ථානාධිපති ඌරගස්මංහන්දිය (ඇල්පිටිය) SCFR 378/19 නඩුවේදී අධිකරණය ප්‍රකාශ කර ඇත්තේ, 13(1) ව්‍යවස්ථාව යටතේ යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගන්නා විට නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටිය අනුව එම අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතු බවත්, යම් සොරකමකට වරද පිළිනොගන්නේ නම්, අත් බෝම්බයක් සන්තකයේ තබා ගැනීමේ වරදට වරදකරු කරන බවට චෝදනා ගොනු කරන බවට නිලධාරීන් විසින් තර්ජනය කිරීමෙන් අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම නීති විරෝධී බවත්, එසේම වරද පිළිනොගැනීම මත අත්අඩංගුවේදී වධහිංසා පැමිණවීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව සහ 13(1) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කිරීමක් සිදුවන බවයි.

හේවාමුනමුල්ලගේ අජිත් සහ අකිල එරෙහිව වැලිගම පොලිසිය SCFR 387/2013 නඩුවේදී දෙවන පෙත්සම්කරු තම සහෝදරයාව පොලිස් ස්ථානයට ගෙන ඒමට එකඟ වූ නමුත්, පළවන වගඋත්තරකාර ස්ථානාධිපතිවරයා විසින් කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර දෙවන පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම සහ පළවන පෙත්සම්කරු පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගැනීම තුළින් අධිකරණය ප්‍රකාශ කලේ දෙවන පෙත්සම්කරුව අත්අඩංගුවට ගැනීමට හේතු දැක්වීමක් සිදුකර නොමැති බවත්, අවශ්‍ය කාලය තුළ මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කර නොමැති බවත්, මෙම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී බවත්, 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් පැහැදිලිව උල්ලංඝනය කිරීමක් බවයි.

ආර්.ඊ.සුසිල් ප්‍රියංකර සෙනෙවිරත්න එරෙහිව පී.ප්‍රසන්න කරුණාජීව සහ අනෙක් අය තඹුත්තේගම පොලිසිය SCFR 690/12 නඩුවේදී සොරකමක් සම්බන්ධයෙන් සැකපිට පොලිසිය විසින් පෙත්සම්කරුව අත්අඩංගුවට ගන්නා ලද අතර, අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරීන් සතුව පැහැදිලි හෝ විශ්වාසදායක සාක්ෂියක් නොතිබූ අතර, පෙත්සම්කරුව කිසිදු නීතිමය පදනමක් නොමැතිව අත්අඩංගුවට ගැනීම, අත්අඩංගුවට ගැනීමට හේතු දැක්වීමට අපොහොසත්වීම, නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර අත්අඩංගුවට ගැනීමක් බවත්, පරීක්ෂණයෙන් පසුව බොරු චෝදනා එල්ල කිරීම පැහැදිලිවම 13(1) වන ව්‍යවස්ථාව උල්ලංඝන කිරීමක් බව අධිකරණය ප්‍රකාශ කළ අතර, තවදුරටත් අධිකරණය ප්‍රකාශ කර ඇත්තේ වලංගු නීතිමය පදනමක් නොමැතිව, වැරදි අනන්‍යතාවයක් සහ නොපැහැදිලි චෝදනාවක් මත අත්අඩංගුවට ගැනීම අත්තනෝමතික සහ අසාධාරණ අත්අඩංගුවට ගැනීමක් බවයි.

ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත සහ වෙනත් අය (SC FR 677/2012) නඩුවේදී යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සිදුකරන්නේ නම්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට දක්වා ඇති අතර, අභිමතය පරිදි හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන මඟින් වලක්වා ඇත.

ඒ අනුව ඉහත සමස්ත කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුව හේතු නොදක්වා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන පහරදී අසත්‍ය චෝදනා මත අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12(1) සහ 13(1) ව්‍යවස්ථාවන් මඟින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බව නිර්දේශ කරමි.
ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.

01. 1, 2 සහ 3 වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් විසි පන්දහස (රු. 25,000/-) ක මුදලක් බැගින් රුපියල් හැත්ත පන්දහසක (75,000/-) මුදලක් පැමිණිලි පාර්ශවය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

02. 1, 2, සහ 3 වගඋත්තරකරුවන්ගේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති විසින් පියවර ගත යුතුය.

03. 3 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුගේ අත් ඔරලෝසුව බලෙන් ලබාගැනීමක් සිදුකර ඇති බවට කරුණු ඉදිරිපත් වන බැවින්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර එය තහවුරු වන්නේ නම් අපරාධ නීතිය යටතේ ඔහුට විරුද්ධව කටයුතු කල යුතු බවට ද නිර්දේශ කරමි.

2025. 09.18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
පොලිස් මූලස්ථානය,
කොළඹ.

සැ.යු. - අදාළ මුදල් මුදල් ඇණවුමක් මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන්න.